## ජාතික රක්ෂණ භාර අරමුදල

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ජාතික රක්ෂණ භාර අරමුදල 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 ශ ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 අනුව වසර 05 කින් ක්ෂය කළ යුතු වුවත්, ශ්‍රී ලංකා රක්ෂණ භාර අරමුදලේ පරිගණක වසර 06 කින් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි.

##### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2002 සහ 2004 වර්ෂවල රජයේ ප්‍රදානයක ලෙස ලැබී තිබුණු පිළිවෙලින් රු.267,600 ක් සහ රු.451,590 ක් වූ කාර්යාල උපකරණ පිරිවැය වටිනාකම අදාල වර්ෂයන්හිදී රජයේ ප්‍රදාන ලෙස හඳුනා ගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුව වර්ෂ 8 කින් සහ 6 කින් පිළිවෙලින් රු.33,450 ක් සහ රු.75,265 ක් වාර්ෂිකව ආදායමට ගත යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකර 2010 වර්ෂයේදී ඒ දක්වා එකතු වූ සමුච්චිත මුදල රු.434,860 ක් ආදායම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.326,145 ක් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.2.3 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.187,756,188 ක් වූ සහන කොන්දේසි ණය ශේෂය අයකර ගැනීමේ ප්‍රගතිය ඉතා දුර්වල මට්ටමක පැවතුණි.

### 1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතු වටිනාකම රු.5,574,107,464 ක් ව ආයෝජනවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට අදාල ශේෂ සනාථ කිරීමේ ලිපි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| මුදල් රෙගුලාසි 757 (2) | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යාතන චක්‍රලේඛයේ 4.2 ඡේදය | අරමුදල විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. |

### 1.2.6 දෘෂ්‍ය අක්‍රමිකතා/ අවිධිමත් ගනදෙනු

ශාඛා කළමනාකරුවන්ට ප්‍රවාහන දීමනා ගෙවීමේදී එම නිලධාරීන්ගේ නමට චෙක්පත් නිකුත් නොකර වෙනත් නිලධාරියකුගේ නමට චෙක්පත් නිකුත් කර පසුව එම නිලධාරියා විසින් ශාඛා කළමනාකරුවන්ගේ ගිණුම්වලට මුදල් තැන්පත් කර ඇති බව නිරීක්ෂණය විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.2,330,614,859 ක අතිරික්තයක් වූ අතර, 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු අතිරික්තය රු.3,202,833,204 ක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.872,218,345 ක පිරිහීම සඳහා ශුද්ධ රක්ෂණ වාරික ආදායම අඩුවීම, සේවක මණ්ඩල පිරිවැය වැඩිවීම යන කරුණු බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත සහ සත්‍ය කාර්ය මණ්ඩල අනුව අරමුදලේ තනතුරු 39 ක් අතිරික්තව පවතින අතර එක් කළමනාකරණ තනතුරක පුරප්පාඩුව පැවතුණි.

(ආ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියකින් තොරව 2010 වර්ෂයේ සේවකයන් 42 දෙනෙකු කොන්ත්‍රාත් පදනමට බඳවා ගෙන වැටුප් හා දීමනා වශයෙන් රු.796,000 ක් ගෙවා තිබුණි.

(ඇ) බඳවා ගැනීම් පරිපාටියේ සුදුසුකම් සපුරා නොමැති ශාඛා කළමනාකරුවන් දෙදෙනෙකුට 2010 වර්ෂයේ වැටුප් හා දීමනා වශයෙන් රු.137,000 ක් ගෙවා තිබුණි.

(ඈ) නිලධාරීන් හය දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි අධ්‍යාපන සුදුසුකම් තහවුරු කරගෙන නොතිබුණි.

(ඉ) අනුමත කාර්ය මණඩලයේ නීති නිලධාරී තනතුරක් නොතිබියදී රු.25,640 බැගින් මාස තුනක් වෙනුවෙන් නීති නිලධාරීන් දෙදෙනෙකුටද රු.25,000 ක් එක් මාසයක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නීති නිලධාරියකු වෙනුවෙන්ද ගෙවීම් කර තිබුණි.

### 2.2.2 ආර්ථික නොවූ ගනුදෙනු

අරමුදලේ කාර්යාලය වෙනත් ස්ථානයකට ගෙන යාම නිසා එතෙක් බදු පදනම මත ලබාගෙන තිබුණු සමුපාකාර තොග වෙළඳ සංස්ථාවේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට දරන ලද රු.14,102,286 ක් නිශ්ඵල වියදමක් වී තිබුණි.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(i) ගිණුම්කරණ ප්‍රතිපත්ත හා හෙළිදරව් කිරීම්
(ii) කාර්ය මණ්ඩල බඳවා ගැනීම
(iii) කාර්ය සාධනය